*සැ.යු.:* 2025.09.19 දින පළ කරන ලද අංක 2455 *ගැසට් පත්‍රයේ* II (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,456 - 2025 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් | — |
| අවසාන නියෝග | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | 354 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | 359 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 17 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 03 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

353 - B 082723 - (2025/09)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාතේ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "එච්" කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර ඉම්හාමි මුදියන්සේලාගේ උභය කල්‍යාණ කුමර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2008.08.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක කුරු/එච්/මීග/ප්‍ර/3178 (වාරි) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අන්දරවැව, වැලියාව, මීගලැව පදිංචි රත්නායක මුදියන්සේලාගේ කුඩා බණ්ඩා යන අය වෙත ප්‍රදානය කොට නිකවැරටිය දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 877 යටතේ 2009.04.21 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 103, වැලියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැලියාව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කුරුණෑගල මිනින්දෝරු අධිකාරිය භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ල. මැ. ග. පි. 3976/3 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 456 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.260 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

මායිම් :-

| | |
|---|---|
| *උතුරට* | : අංක 459, 455 බිම් කැබලි, |
| *නැගෙනහිරට* | : අංක 455 හා අ. ග. පි. 3982 වැලියාව, |
| *දකුණට* | : අංක 457 හා අ. ග. පි. 3982, |
| *බටහිරට* | : අංක 457, 459 බිම් කැබලි. |

අයි. එම්. උභය කල්‍යාණ කුමාර,
නේවාසික ව්‍යාපාර කළමනාකාර,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
"එච්" කලාපය - තඹුත්තේගම.

2025 මැයි මස 26 වැනි දින.

09 - 229

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987 ජූනි 04 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/4358 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මාගස්තොට IV වන පියවර පදිංචි අන්තෝන් රම්ලාන්සි රාජුඩීන් වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ11/980/87 අංකය යටතේ 1987 ඔක්තෝබර් 22 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත පත්තුවේ/කෝරළේ බ්ලැක්පූල් (රුවන්රළිය) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්ලැක්පූල් නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය සර්වේයර් ජනරාල්වරයා භාරයේ ඇති අංක පි. පි. නු 851 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 51 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.112 ක් ඇතැයි ගණන් බලා තිබෙන මාගස්තොට IV වන පියවර යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :

| | |
|---|---|
| *උතුරට* | : පි.පි.නු 851 පිඹුරේ සඳහන් කැබලි අංක 45, |
| *නැගෙනහිරට* | : පි.පි.නු 851 පිඹුරේ සඳහන් කැබලි අංක 37, |
| *දකුණට* | : පි.පි.නු 851 පිඹුරේ සඳහන් කැබලි අංක 52, |
| *බස්නාහිරට* | : පි.පි.නු 851 පිඹුරේ සඳහන් මායිම් ගල් |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2023 දෙසැම්බර් 28 වැනි දින.

09 - 242/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යමපළාතේ පළාත්සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987 ඔක්තෝබර් 15 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/4670 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බ්ලැක්පූල් (රුවන්එළිය) පදිංචි රත්නායක මුදියන්සේලාගේ සමරවතී වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/11/53/88 අංකය යටතේ 1988.01.27 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත පත්තුවේ/කෝරළේ බ්ලැක්පූල් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්ලැක්පූල් (රුවන්එළිය) නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 69/6/1 සහ 69/6/3 දරන ක්ෂේත්‍රපත්‍රයෙහි අංක පි. පි. නු 851 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 48 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.082 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම:

| | |
|---|---|
| *උතුරට* | : පි.පි.නු 851 පිඹුරේ සඳහන් කැබලි අංක 41, |
| *නැගෙනහිරට* | : පි.පි.නු 851 පිඹුරේ සඳහන් මහගස්තොට වත්ත, |
| *දකුණට* | : පි.පි.නු 851 පිඹුරේ සඳහන් කැබලි අංක 49, |
| *බස්නාහිරට* | : පි.පි.නු 851 පිඹුරේ සඳහන් කැබලි අංක 37. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2023 නොවැම්බර් මස 24 වැනි දින.

09 - 242/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යමපළාතේ පළාත් සභාවේ, නුවරඑළියදිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1985 ජනවාරි 18 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/2556 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන සීතාඑළිය පදිංචි විජේරත්න හලුගේ සයිමන් මහතා වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/12/1602/86 අංකය යටතේ 1986.09.25 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර කෝරළේ ගොරඩිහෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සීතාඑළිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක පි. පි. නු. 845 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 07 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.184 පමණ විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : පි.පි.නු 845 කැබලි අංක 08, |
| *නැගෙනහිරට* | : පි.පි.නු 845 කැබලි අංක 09, |
| *දකුණට* | : පි.පි.නු 845 කැබලි අංක 14, |
| *බස්නාහිරට* | : පි.පි.නු 845 කැබලි අංක 08. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2025 පෙබරවාරි මස 11 වැනි දින.

09 - 242/3

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ, පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1985 ජනවාරි 18 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/2629 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බ්ලැක්පූල් පදිංචි මයිකල් වජිම් විලියම්ස් වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/11/1554/86 අංකය යටතේ 1986.09.25 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර කෝරළේ බ්ලැක්පූල් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්ලැක්පූල් නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක පි. පි. නු. 832 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 15 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.174 ක් ඇතැයි ගණන් බලා තිබෙන මාගොඩ පතන යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම :

*උතුරට* : පි.පි.නු 832 පිඹුරේ සඳහන් කැබලි අංක 26,
*නැගෙනහිරට* : පි.පි.නු 832 පිඹුරේ සඳහන් කැබලි අංක 26 සහ 21,
*දකුණට* : පි.පි.නු 832 පිඹුරේ සඳහන් කැබලි අංක 20,
*බස්නාහිරට* : පි.පි.නු 832 පිඹුරේ සඳහන් කැබලි අංක 14.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 ඔක්තෝබර් මස 10 වැනි දින.

09 - 242/4

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1999 මැයි මස 10 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/1675 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වින්ඩ්කෝනර්, නවජනපදය පදිංචි සහුරුවන් බීබී මහත්මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/41/786/99 අංකය යටතේ 1999.08.11 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර කෝරළේ වින්ඩ්කෝනර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නව ජනපදය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත අංක නු/වි/86/83 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 117 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් 20 පමණ විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම :

*උතුරට* : ජනපද මාර්ගය,
*නැගෙනහිරට* : අංක 116 ඉඩම,
*දකුණට* : අංක 126 ඉඩම,
*බස්නාහිරට* : අංක 118 ඉඩම.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 ඔක්තෝබර් මස 08 වැනි දින.

09 - 242/5

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් මස 08 වැනි දින ප්‍රදානය කර ඇති අංක **මධ්‍යම/නුඑ/628** දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන **බ්ලැක්පූල් නව ජනපදය හි පදිංචි කලුආරච්චි අප්පුහාමිලාගේ ජයමැණිකේ** මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ **නුඑ/11/1133/95** අංකය යටතේ 1995.12.18 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත පත්තුවේ/කෝරළේ වින්ඩිකෝනර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්ලැක්පූල් නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, රජයේ මිනින්දෝරු නිමල් ලියනගේ විසින් සම්පාදිත **අංක නු/වි/86/83** දරන කට්ටි කැඩීමේ පිඹුරේ **අංක 135** දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් 20 ක් පමණ විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : මාර්ගය, |
| *නැගෙනහිරට* | : ලොට් අංක 136, |
| *දකුණට* | : ලොට් අංක 144, |
| *බස්නාහිරට* | : ලොට් අංක 134. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 අගෝස්තු 15 වැනි දින.

09 - 242/6

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එස්. පී. ළිදකුඹුර වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.08.06 වැනි දින ප්‍රදානය කර ඇති **අංක නුඑ/ප්‍ර/3059** දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන **වතුමුල්ල, මහඋඩව වත්ත පදිංචි සන්දනම් අරුලප්පන්** වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක **වල/15/22/87** යටතේ 1987.03.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් සිටි අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත පත්තුවේ 516 බී එගොඩකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, එගොඩකන්ද නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු. පි. නු. 831 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 37 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 0.082 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : මු. පි. නු. 831 සැලැස්මේ කැබලි අංක 24, |
| *නැගෙනහිරට* | : මු. පි. නු. 831 සැලැස්මේ කැබලි අංක 38, |
| *දකුණට* | : මු. පි. නු. 831 සැලැස්මේ කැබලි අංක 43, |
| *බස්නාහිරට* | : මු. පි. නු. 831 සැලැස්මේ කැබලි අංක 36. |

එස්. පී. ළිදකුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2024 ජනවාරි 31 වැනි දින.

09 - 246

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිතාරා රුවිනි ගමගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.08.11 වැනි දින ප්‍රදානය කර ඇති අංක **මධ්‍යම/අකෝ/505** දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන **මොරහේනගම පදිංචි හපුගොඩ වන්නකුරාළලාගේ පියසිරි** වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක **එල්. ඩී. ඕ. බී. 05/241** යටතේ 1994.11.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, අඹගමුව/කෝරළේ 316 ජී කෙහෙල්වරාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මොරහේනගම නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, අංක අ. ග. පි. 115 අති 26 දරන පිඹුරෙහි අංක 838 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.323 ක් ඇතැයි ගණන් බලා තිබෙන **අලුබෝදෙනිය මූකලාන** යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :-

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 115 අති 26 දරන පිඹුරෙහි කැබලි අංක 647, 836 හා 837, |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 115 අති 26 දරන පිඹුරෙහි කැබලි අංක 837, 786 හා 839, |
| *දකුණට* | : අ. ග. පි. 115 අති 26 දරන පිඹුරෙහි කැබලි අංක 839 හා 840, |
| *බස්නාහිරට* | : අ. ග. පි. 115 අති 26 දරන පිඹුරෙහි කැබලි අංක 466 හා 647. |

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2024 ජනවාරි 22 වැනි දින.

09 - 247/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජයසිංහ මුදියන්සේලාගේ චමිල ඉන්දික ජයසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.08.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක **මධ්‍යම/අකෝ/635** දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන **වටවල පදිංචි ලොකු යද්දෙහිලාගේ ප්‍රියන්ත විජේපාල** වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී. 06/245 යටතේ 1995.11.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, අඹගමුව/කෝරළේ වටවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වටවල නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක **එෆ්. වී. පී. පිටිනු 1674** දරන පිඹුරෙහි අංක 17 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.193 ක් ඇතැයි ගණන් බලා තිබෙන වටවල වත්ත යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය:-

| | |
|---|---|
| *උතුරට* | : කැ. අ. 18, 6 2/2 හා 16, |
| *නැගෙනහිරට* | : කැ. අ. 16 හා 46, |
| *දකුණට* | : කැ. අ. 46, 43 හා 18, |
| *බස්නාහිරට* | : කැ. අ. 18. |

ජේ. එම්. සී. අයි. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2025 මාර්තු 05 වැනි දින.

09 - 247/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. නදීර ලක්මාල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2001.11.20 වැනි දින ප්‍රදානය කර ඇති අංක **නු/කොත්/දඹ/ප්‍ර/ගො/80** දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන **හපුගස්තලාව - දඹගල්ල හි පදිංචි සීලගම ගෙදර ඩිංගිරිඅම්මා** වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක **කොත් 24/189/2002** යටතේ 2002.03.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යනුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.10.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පාරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්පනේ කෝරළේ 460 - හපුගස්තලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අහස්වැව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරළිය මැනුම් අධිකාරි භාරයේ ඇති අංක නු. 912 දරන කට්ටි කැඩීමේ පිඹුරේ 27 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම එකයි එකයි එකක් විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - දඹගල්ල වත්ත.

| | |
|---|---|
| *උතුරට* | : උතුරට අංක 26, 04 සහ පි. පි. නු. 743 හි කැබලි අංක 01, |
| *නැගෙනහිරට* | : පි. පි. නු. 743 හි කැබලි අංක 01 සහ මෙම පිඹුරේ කැබලි අංක 28, |
| *දකුණට* | : කැබලි අංක 28 සහ 29, |
| *බස්නාහිරට* | : කැබලි අංක 26. |

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
තිස්පනේ උප කාර්යාලය.

2023 දෙසැම්බර් 07 වැනි දින.

09 - 248

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/78016
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* EP/28/LB/L7/LS/BAT/KPS/19

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු, දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 209, පිල්ලෙවේලි මාඩා පුන්තෝන්ඩම් ග්‍රාම නිලධාරි වසමේ කැඩැස්තර සිතියම් අංක 270053 දරන කලාප 29 න් 21 කලාපයෙහි පත්‍ර අංක 1හි කැබලි අංක 167 දරන පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 01 කට අදාළව රජයේ ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා ශ්‍රී සිව මුත්තු මාරිඅම්මාන් කෝවිලේ භාරකාර මණ්ඩලය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ:

| | |
|---|---|
| *උතුරට* | : Lot 147; |
| *නැගෙනහිරට* | : Lot 147; |
| *දකුණට* | : Lot 166; |
| *බටහිරට* | : Lot 166. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහ (30) යි (2025.07.23 දින සිට ඉදිරියට)
*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට වර්ෂයක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම **ආගමික කටයුතු සඳහා** හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බදු ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය පළකරන* දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -223

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/74072
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* EP/28/LB/L7/LS/BAT/KPS/10

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු, දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුනරි බටහිර ග්‍රාම නිලධාරි වසමේ, මුල්ලිවඩ්ඩවාන් ගමේ ජනපද නිලධාරි විසින් සකස් කරන ලද දළ අනුරේඛනයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 0.75 ක් වූ රජයේ ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා ශ්‍රී මුතුමාරි අම්මාන් කෝවිලේ භාරකාර මණ්ඩලය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

*උතුරට* : රජයේ ඉඩම්,
*නැගෙනහිරට* : පාර,
*දකුණට* : රජයෙ ඉඩම්,
*බටහිරට* : රජයේ ඉඩම්.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - **අවුරුදු තිහ (30) යි (2025.07.23** දින සිට ඉදිරියට)
*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට වර්ෂයක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම **ආගමික කටයුතු සඳහා හැර** වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බදු ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය පළකරන* දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -224

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/75255
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* EP/28/LB/L7/LS/BAT/KP/15

### 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු, දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 209, පෙරිල්ලවේලි ග්‍රාම නිලධාරි වසමේ, පල්ලෙත්තුවේනයි ගමේ ඉඩම් නිලධාරි විසින් සකස් කරන ලද දළ අනුරේඛනයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 1/2 ක් වූ රජයේ ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා Kurunthaiyadi Sri Siththi Vinayagar Temple Trust Board නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : පට්ටතුවේනෙ පාර, |
| *නැගෙනහිරට* | : රජයේ ඉඩම්, |
| *දකුණට* | : රජයේ ඉඩම්, |
| *බටහිරට* | : වැව් රක්ෂිතය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහ. (30) යි (2025.07.23 දින සිට ඉදිරියට)
*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට වර්ෂයක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම **ආගමික කටයුතු සඳහා** හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ජේ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -225

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/39300
*සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය :* KN/ALC/LTL/1062

### 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 227 කන්තලේ නගරය ග්‍රාම නිලධාරි වසමේ, කන්තලේ නගර කොට්ඨාසය ගමේ එෆ්. ටී. පී. 02 පිඹුරේ අතිරේක අංක 57 හි කැබලි අංක 2925න් කොටසක් දැක්වීමට අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 20ක් වූ රජයේ ඉඩම් කොටස සමිති කාර්යාල කටයුතු සඳහා වැඩිහිටි බල මණ්ඩලයේ භාරකාර මණ්ඩලය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 2919, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 2925 හි කොටසක්, |
| *දකුණට* | : කැබලි අංක 2927, |
| *බටහිරට* | : මාර්ගය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

(අ) *බදු කාලය.* - අවුරුදු පහයි. (05) (2025.07.23 දින සිට 2030.07.22)

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම **සමිති කටයුතු සඳහා හැර** වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ පළ* කල දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -226

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/68877
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NCP/PLC/L09/23/04-2021

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 168, උඩවෙල ග්‍රාම නිලධාරි වසමේ, උඩවෙල ගමේ අ. ජ. පි. පො. 160 අති. අංක 386 පත්‍ර අංක 401 පිඹුරේ කැබලි අංක 3884 දරන ප්‍රමාණයෙන් රූඩ් 01 පර්. 27.3 (හෙක්. 0.1701) පමණ ඉඩම් කොටස සුහසාධක කටයුතු සඳහා වෘත්තීය පුහුණු පාසලක් හා නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා සේවා මුක්ත හට සංගමය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 3883 සහ 3882, |
| *නැගෙනහිර* | : කැබලි අංක 3882 සහ 3885, |
| *දකුණට* | : කැබලිඅංක 3885, 3886, 1539, 1538 සහ 1537, |
| *බටහිරට* | : කැබලි අංක 1537, 3886 සහ 3883 |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

(අ) *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.07.23 දින සිට 2055.07.22 දින දක්වා)

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

වාර මුදල : අය නොකෙරේ.

(ආ) මෙම ඉඩම සුහසාධන කටයුතු සඳහා වෘත්තීය පුහුණු පාසලක් හා නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඇ) මෙම බද්ද ඇරඹි අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2025.07.23 දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. ජී. පී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 10 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -227

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/77792
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* EP/28/LB/L7/LS/BAT/KPS/21

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු, දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 203, කිරාන් නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ, සින්නවේම්පු ගමේ පී. පී. මඩ. 2298, කැබලි අංක 44 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5269 කට අදාළව රජයේ ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා Sri Siththi Vinayagar Temple Trust Board නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | |
|---|---|
| *උතුරට* | : Lot - 9, |
| *නැගෙනහිර* | : Lot - 45, |
| *දකුණට* | : Lots - 46, 47, |
| *බටහිරට* | : Lot - 43. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.07.23 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල .*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*(ආ)* බදුගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට වර්ෂයක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම් ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදුගන්නන් විසින් මෙකී ඉඩම ආගමික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන්

ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 12 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -274

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/77531
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* PLC/L8/37/23/135-2022

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 632 ඒ, ඉළිඹ ග්‍රාම නිලධාරි වසමේ, ඉළිඹ ගමේ දළ අනුරේඛන අංක මදු/ඉ/02/06/14-ii හි කැබලි අංක A දරන රූඩ් 02, පර්චස් 10 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් ආගමික කටයුතු සඳහා ශ්‍රී ගෞතමාරාමය දසසිල් මාතා ආරාමයේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | |
|---|---|
| *උතුරට* | : මු. පි. ක. 1759 හි කැබලි අංක 39 සහ 40 න් කොටසක්, |
| *නැගෙනහිර* | : මු. පි. ක. 1759 හි කැබලි අංක 41 හා ප්‍රවේශ මාර්ගය, |
| *දකුණට* | : මු. පි. ක. 1759 හි කැබලි අංක 41 සහ කටුහේන වත්ත, |
| *බටහිරට* | : මු. පි. ක. 1759 හි කැබලි අංක 39 සහ කටුහේන වත්ත. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.07.23) දින සිට ඉදිරියට

*(ආ)* *වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* - නැත

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ආගමික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් ඉඩමේ භුක්තිය භාර දුන් දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම *නිවේදනය* පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 08 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -275

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/78205
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NWP/PLC/L9/MH/LTL/20

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 147 කුඹුක්වැව ග්‍රාම නිලධාරි වසමේ, කුඹුක්වැව ගමේ අ. ග. පි. 1852 පිඹුරෙහි කැබලි අංක 317 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2582 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ඉම්හාමි මුදියන්සේලාගේ දිල්රුක්ෂිකා මල්කාන්ති මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 315 සහ කැබලි අංක 316, |
| *නැගෙනහිර* | : කැබලි අංක 316 සහ කැබලි අංක 103, |
| *දකුණට* | : කැබලි අංක 103 සහ කැබලි අංක 318, |
| *බටහිරට* | : කැබලි අංක 318. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහ (30) යි. (2025.07.23 දින සිට 2055.07.22 දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස් /ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ)/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.07.23 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(ඒ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -276

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/76851
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NWP/PLC/L9/AL/LTL/11

### 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 985, කන්දෙගෙදර උතුර ග්‍රාම නිලධාරි වසමේ, කන්දෙගෙදර ගමේ, අ. ග. පි. 444 හි කැබලි අංක 684 මඟින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2326 පමණ වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා බයෝමික් ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

*උතුරට* : කැබලි අංක 683,
*නැගෙනහිර* : කැබලි අංක 683,
*දකුණට* : කැබලි අංක 685,
*බටහිරට* : කැබලි අංක 683.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහ (30) යි. (2025.07.23 දින සිට 2055.07.22 දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස් /ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ)/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.07.23 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(ඒ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -277

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/72065
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NWP/PLC/L9/PW/LTL/08

### 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 1413 දහනැක්ගෙදර ග්‍රාම නිලධාරි

වසමේ, දහනැක්ගෙදර ගමේ අ. ග. පි. 2111 හි කැබලි අංක 02 න් කොටසක් දැක්වීම සඳහා ජනපද නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයෙහි කැබලි අංක "A" දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 14.5 ක් විශාල වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා සීමාරහිත දහනැක්ගෙදර සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස (අ. ග. පි. 2111 හි කැබලි අංක 2 න් කොටසක්), |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස (අ. ග. පි. 2111 හි කැබලි අංක 2 න් කොටසක්), |
| *දකුණට* සහ *බටහිරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහ (30) යි. (2025.07.23 දින සිට 2055.07.22 දින දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2025 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම සමිතිය හා බැංකු කටයුතු පවත්වාගෙන යාම මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.07.23 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,<br>
සහකාර ඉඩම් කොමසාරිස්,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,<br>
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,<br>
"මිහිකත මැදුර",<br>
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -278

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/78203<br>
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NWP/PLC/L9/WE/LTL/02

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 846 සඳගල දකුණ ග්‍රාම නිලධාරි වසමේ, කොහාන ගමේ P. P. A. 1201 පිඹුරෙහි කැබලි අංක 170 න් කොටසක් සඳහා ඉඩම් නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛන අංක 2023/2 හි කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 26 ක් වූ රජයේ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා එකමුතු අවමංගල්‍යාධාර සමිතියේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 169, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 169, 171, |
| *දකුණට* | : කැබලි අංක 171, |
| *බටහිරට* | : කැබලි අංක 170, 173 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු පහ (අවු. 05) යි. (2025.07.23 දින සිට 2030.07.22 දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* :- නැත.

*(ඇ)* මෙම ඉඩම සමිති කටයුතු පවත්වාගෙන යාම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(එ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 -279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.